ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.08.10

ඒ. එන්. උදයසිරි මයා
වැරැල්ලවත්ත, මාගම්මන ,
දෙහිඕවිට.

පැමිණිලිකාර පාර්ශවය

01. වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
වයඹ පළාත, කුරුණෑගල.

02. ලේකම්
පළාත් කෘෂිකර්ම වාරිමාර්ග ධීවර සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය, කුරුණෑගල

03. ලේකම්
වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
කුරුණෑගල.

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය :HRC/1468/23</u>**

<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

උක්ත පැමිණිලිකරු වන ඒ.එන්.උදයසිරි යන අය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තමා සමස්ත ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සම්මේලනයේ සභාපතිවරයා ලෙස වෘත්තිය සමිති කටයුතුවල නියැලීම සඳහා පූර්ණ කාලීනව නිදහස් වීමේ අවශ්‍යතාව මත රාජ්‍ය සේවයෙන් වැටුප් සහිත නිවාඩු ලබා ගැනීම සඳහා අයදුම්පතක් වයඹ පළාත් කෘෂිකර්ම,වාරිමාර්ග,සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය සහ ගොවි ජන සංවර්ධන අමාත්‍යාංශය ලේකම්වරයා හා වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ මගින් 2022.10.12 දිනැතිව ඉදිරිපත් කර ඇති බවයි.

එම අයදුම්පත වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් සේවා අවශ්‍යතාවය යන කරුණ පදනම් කරගෙන ප්‍රතික්ෂේප කරමින් එම අමාත්‍යාංශයේ ඉහළ අධිකාරිය වෙත එලෙස ප්‍රතික්ෂේප කිරීමට

හේතු සම්බන්ධව සාවද්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බවත්, අමාත්‍යාංශයේ ඉහළ අධිකාරිය මඟින්ද කිසිදු සොයා බැලීමකින් තොරව වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් ගනු ලැබූ එම තීරණයම අනුමත කරමින් තමාගේ නිවාඩු ඉල්ලීම අනුමත නොකර තමාට රාජ්‍ය සේවකයෙකු ලෙස හිමිවිය යුතු වෘත්තීය සමිති කටයුතු වල නිරත වීමට පූර්ණකාලීනව නිවාඩු ලබා ගැනීමේ අයිතිය උල්ලංඝනය කර ඇති බවයි. තවද පැමිණිලිකරු කියා සිටින්නේ එකී තීරණ මත පදනම්ව තම සම්මේලනය විසින් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කර ඇති අභියාචනාද එම කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇති බවයි. එසේ සිදු කර ඇත්තේ ඒ සම්බන්ධයෙන් විධිමත් සොයා බැලීමකින් තොරව බවටද කරුණු දක්වා ඇත. එසේම පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව රජයේ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීමේ ක්‍රමවේදය තුළ දී තමා හටද රාජ්‍ය සේවකයෙකු ලෙස හිමි විය යුතු පූර්ණ කාලීනව රජයේ සේවයෙන් නිදහස් වී වෘත්තීය සමිති කටයුතුවල නියැලීම සඳහා නිවාඩු ලබා ගැනීමේ අවස්ථාව 2022.12.02 සිට 2023.12.02 දක්වා වසරක කාල පරිච්ඡේදය සඳහා ලබා දී නොමැති බවයි. එබැවින් වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති ලෙස පූර්ණ කාලීනව වසරක කාලයක් වෘත්තීය සමිති සම්මේලනය වෙනුවෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට තමාට තිබූ අවස්ථාව උක්ත වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියා කලාපය හේතුවෙන් අහිමි වී ඇති බවය.

මෙහිදී පැමිණිලිකරු වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ 2022.10.02 දිනැතිව ඉදිරිපත් කරන ලද අයදුම්පත වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයා ඉහළ නිලධාරීන් වෙත යොමු කර ඇත්තේ මාස දෙකකට ආසන්න කාලයක් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගෙන කල්ගත කිරීමෙන් අනතුරුව බවයි. තවද පළාත් අධ්‍යක්ෂක වෙත යොමු කරන ලද අයදුම්පත සඳහා පළාත් අධ්‍යක්ෂකවරයා විසින් අනුමැතිය ලබාදී නොමැති බවත් එලෙස අනුමැතිය ලබා නොදීමට හේතුන් ලෙස දක්වා ඇත්තේ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි උපදේශකවරුන් 13 දෙනෙකු සඳහා පුරප්පාඩු පැවතීම, උපදේශකවරුන් 04 දෙනෙකු විදේශගතව තිබීම, හා තවත් නිළධාරින් 10 දෙනෙකු අධ්‍යයන නිවාඩු ලබා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබමින් සිටීම, නිලධාරිනියන් 05 දෙනෙකු ප්‍රසූත නිවාඩු ලබා රාජකාරි කටයුතුවලින් බැහැරව සිටීම සහ කෘෂිකර්ම උපදේශකවරුන් 30 දෙදෙනෙකු ක්ෂේත්‍ර රාජකාරියෙන් ඉවත්ව සිටීම යන කාරණාවන්ය. එම කාරණා මත පදනම්ව තවදුරටත් කෘෂිකර්ම උපදේශකවරුන් හට පූර්ණ කාලීන සේවයෙන් නිදහස් කිරීමට හැකියාවක් නොමැති බවට දන්වා ඇති බවයි.

එකී අයදුම්පත සම්බන්ධව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් ගනු ලැබූ උක්ත තීරණය වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්ද අනුමත කරමින් තමාට ඒ බව දැනුවත් කර ඇති බවත්, එහිදී තමා විසින් ඉල්ලා ඇති ඉල්ලීමට අදාළ අයදුම්පත සම්බන්ධයෙන් පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ද සාධාරණත්වයක් ඉටු කර නොදී අනීතික ලෙස තවදුරටත් කටයුතු කර ඇති බව පැමිණිලිකරු කියා සිටී.එසේම වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින්ද වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් හා වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් ගනු ලැබූ තීරණය අනුමත කරමින් වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 145 සිට 148 දක්වා වන වගන්තීන් හි පවතින ප්‍රතිපාදන වලට පටහැනිව බලය අයුතු ලෙස භාවිතා කරමින් කටයුතු කර ඇති බවටද පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත.

මෙහිදී පැමිණිලිකාර පාර්ශවය විසින් පහත කාරණාවන් පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.

1. වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 144 වන වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කර ඇත.

2. කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 145 වන වගන්තියේ xiii වන උප වගන්තියෙ සඳහන් පරිදි කටයුතු නොකරමින් සිය බලය ඉක්මවා කටයුතු කර තිබීම.
3. කෘෂිකර්ම උපදේශකවරුන්ගේ පුරප්පාඩුව 32 දෙනකු පවතින බව දැන්වුවද සත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 13 බවට දක්වා තිබීම.
4. තමා විසින් වෘත්තිය සමිති කටයුතු සඳහා නිදහස් වීමේ අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රජයේ සේවයෙන් පූර්ණ කාලීනව නිදහස් විම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද කෘෂිකර්ම උපදේශකවරුන් හට වෙනත් අවශ්‍යතාවයන් සඳහා පූර්ණ කාලීනව සේවයෙන් නිදහස් කර තිබීම.
5. තමා විසින් පළමුවර හා දෙවනවර නිදහස් වන විට බඳවාගෙන නොතිබූ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ක්ෂේත්‍ර කටයුතු සඳහා සහය වීම පිණිස බඳවා ගත් කෘෂිකර්ම තාක්ෂණ
6. සහයක නිලධාරීන් 53 ක් 2021.08.02 සිට සේවය නිරතව සිටීම හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් හිඟයක් පවතින බවට පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් සිදු කරන ලද දැනුම් දීම සම්පූර්ණ අසත්‍යයක් බව.
7. වෘත්තීය සමිති සම්මේලන සඳහා ආයතන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/97 හි විධිවිධාන නොසලකා හැර කටයුතු කර තිබීම.

එසේම තම පැමිණිල්ල මගින් පැමිණිලිකාර පාර්ශවය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ ලංකාව පුරා විසිරී පවතින වෘත්තීය සංගම් 10 ක් එකාබද්ධව ගොඩනගාගෙන ඇති තම සම්මේලනයේ කටයුතු වඩාත් විධිමත්ව හා රජයේ සේවකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි පවත්වාගෙන යාමට ඉහත නිදහස් නොකිරීම දැඩිව බලපා ඇති බවත්, එමගින් සම්මේලනයේ සාමාජිකයන්ගේ ගැටලු, සංගම්වල ප්‍රශ්න සඳහා විසඳුම් ලබා ගැනීම ඇතුළු බොහෝ කාර්යයන් යථා පරිදි පවත්වා ගෙන යාම අඩපන වූ බවයි. මේ අනුව පැමිණිලිකාර පාර්ශවය ඉල්ලා ඇත්තේ අනීතික ක්‍රියාවන් සිදු කළ නිලධාරීන් සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාව මගින් සාධාරණ විමර්ශනයක් පවත්වා රාජ්‍ය සේවයේ පවතින ප්‍රතිපාදන මත වෘත්තිය සමිති සම්මේලන කටයුතු සඳහා ආයතන සංග්‍රහයෙන් ලැබෙන වරප්‍රසාද හා අයිතිවාසිකම් කඩ නොවන පරිදි සම්මේලනයේ සභාපතිවරයා හට වෘත්තීය සමිති කටයුතු කරගෙන යාම සඳහා බලධාරීන්ට නියෝග ලබා දෙන ලෙසටය.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

<u>3 වන වගඋත්තරකාර වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ කරුණු දැක්වීම</u>

3 වන වගඋත්තරකාර වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2024.10.11 දින හා PPSC/AD17/3/5/2021 අංක දරන ලිපිය මගින් මෙම කොමිෂන් සභාව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් හමන්ගල්ල කෘෂිකර්ම උපදේශක කාර්යාලයේ කෘෂිකර්ම උපදේශකවරයෙකු ලෙස පැමිණිලිකාර ඒ. එන්. උදයසිරි මහතා සේවයේ නියුතු බවයි. ඒ මහතා විසින් කර ඇති ඉල්ලීම මත, කඩඉම් නිර්දේශ වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව හා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත 2019.12.02 දින සිට අවස්ථා කිහිපයකදී පූර්ණ කාලීනව සමස්ථ ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සම්මේලනයේ වෘත්තිය කටයුතු සඳහා ඉල්ලා ඇති කාල පරිච්ජේදයන්ට අදාලව පහත පරිදි කෘෂිකර්ම උපදේශක තනතුරින් නිදහස් කර ඇති බවයි.

i. 2019.12.02 දින සිට 2020.12.01 දින දක්වා

ii. 2020.12.02 දින සිට 2021.12.02 දින දක්වා

iii. 2021.12.02 දින සිට 2022.12.01 දක්වා

එසේම නැවත 2022.12.01 දින සිට 2023.12.02 දින දක්වා තවත් වසරක කාලයකට පූර්ණ කාලීනව සේවයෙන් මුදා හරින ලෙස කරන ලද ඉල්ලීම සලකා බැලීමේදී එවකට ජනපති දැක්ම මත ක්‍රියාත්මක කරමින් පැවති ආහාර හා පෝෂණ මට්ටම සුරැකීමේ වැඩසටහන් සඳහා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සහය අත්‍යාවශ්‍යව තිබූ බවටද කරුණු දක්වා ඇත. තවද ඒ වන විට කෘෂිකර්ම උපදේශකවරුන් තිස් දෙදෙනෙකු (32) ක්ෂේත්‍ර රාජකාරි වලින් ඉවත් වී සිටීම මත දෙපාර්තමේන්තුවේ රාජකාරි සිදු කර ගෙන යාම දුෂ්කර වී ඇති බැවින් මෙම නිලධාරියා මුදාහලහොත් රාජකාරියට බාධා ඇති විය හැකිය බවට වගඋත්තරකරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින්ද දන්වා තිබූ බැවින් ඒ මහතා වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව සේවයෙන් නිදහස් කිරීමට වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර නොමැති බවයි.

එසේම මෙම නිලධාරියා තවදුරටත් පූර්ණ කාලීනව නිදහස් නොකිරීමට වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් නිර්දේශ ලබා දී තිබූ බැවින් මෙම නිලධාරියා රාජ්‍ය සේවයෙන් වෘත්තීය සමිති සම්මේලනයේ කටයුතු සඳහා මුදාහැරීම නිර්දේශ කර නොමැති බවටද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් කරුණු දක්වා ඇත. එසේම වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 145 වන වගන්තිය XIII උප වගන්තිය හා 148 වන වගන්තිය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය ලැබී නොමැති අවස්ථාවකදී එම නිලධාරියා සේවයෙන් මුදා හැරිය නොහැකි බැවින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට 2023.02.02 දින පැවැති වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බවටත් කරුණු දක්වා ඇත.

එසේ වුවද නැවත වරක් 2023.10.02 දින සිට 2024.10.02 දින දක්වා වූ වසරක කාලයක් පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කිරීම අනුමත කර දෙනමෙන් සමස්ථ ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති විසින් ආණ්ඩුකාරතුමා වෙත අභියාචනයක් ඉදිරිපත් තිබූ බැවින් එම අභියාචනයේ සඳහන් කාල සීමාව සඳහා පැමිණිලිකාර නිලධාරී මහතා පූර්ණ කාලීනව මුදා හැරීමට වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් නිර්දේශ කරන ලද බවටද වැඩිදුරටත් කරුණු දක්වා ඇත. මෙහිදී වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ ඉහත නිර්දේශය වෙත එළඹ ඇත්තේ ආයතන සංග්‍රහයේ XXV වෙනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය සහ වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 143 හි XV උප වගන්තිය හා 147, 148 වගන්ති අනුව බවටය. එසේම වයඹ පළාත් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 145 හි XIII උප වගන්තිය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය ලැබී නොමැති අවස්ථාවක එම නිලධාරියා පූර්ණ කාලීනව මුදා හැරිය නොහැකි බැවින් 2022.12.01 දින සිට 2023.12.02 දින දක්වා කාලයට අදාළව එම නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව ප්‍රකාශ කර ඇත. එබැවින් අනුමත ක්‍රියාපටිපාටිය අනුව කටයුතු කර ඇති බැවින් මෙම පැමිණිලිකරුගේ මානව හිමිකම් කඩවන අයුරින් තම ආයතනය කටයුතු කර නොමැති බවට වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් කරුණු දක්වා ඇත.

<u>2 වන වගඋත්තරකාර වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග,ධීවර,සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ කරුණු දැක්වීම</u>

2 වන වගඋත්තරකාර වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග,ධීවර,සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2024.10.14 දිනැතිව මෙම කොමිෂම වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව මගින් කරුණු දක්වා ඇත්තේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන කෘෂිකර්ම උපදේශක ඒ. එම්. උදයසිරි මහතා සමස්ත ලංකා කෘෂිකර්ම උපදේශක සංගමයේ වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණකාලීනව 2019.12.02 දින සිට ඉදිරියට වසර 03 ක් දක්වා එනම් 2022.12.01 දින දක්වා කෘෂිකර්ම උපදේශක තනතුරේ රාජකාරි කටයුතු වලින් වාර්ෂිකව මුදාහැර තිබූ බවයි. එසේම ඒ මහතා නැවතත් එම සංගමයේ සභාපති ලෙස කටයුතු කිරීම සඳහා 2022.12.02 දින සිට 2023.12.01 දින දක්වා වසරක කාලයක් පූර්ණ කාලීනව අදාළ තනතුරේ රාජකාරි කටයුතු

වලින් මුදාහැර දෙන ලෙස අදාළ සංගමය හරහා 2022.10.02 දිනැතිව ඉල්ලීමක් සිදුකර තිබූ බවයි. නමුත් රාජකාරි අවශ්‍යතාව සලකා බලා උක්ත සඳහන් නිලධාරියා තවදුරටත් සේවයෙන් නිදහස් කිරීමේ හැකියාවක් නොමැතිට බව වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තම අමාත්‍යාංශය විසින් දන්වා යැවූ බවටද කරුණු දක්වා ඇත. එසේම මෙහිදී වයඹ පළාත් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ 145 (viii) වගන්තිය අනුව එම නිලධාරි මහතා මුදාහල හොත් රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට දුෂ්කර වන බවටද කරුණු දක්වා ඇත.

එසේම වයඹ පළාත් ආණ්ඩුකාරවරයා වෙත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය පනවා ඇති බවත් ඒ අනුව වයඹ පළාත තුළ රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේදී වයඹ පළාත් කාර්යය පටිපාටි රීති සංග්‍රහය යොදා ගනු ලබන බවටද කරුණු දක්වා ඇත. තවද මෙම කාර්යය පටිපාටික රීති සංග්‍රහය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.08.28 දිනැති ගැසට් පත්‍රයේ iv (අ) වැනි කොටසේ පළකර තිබූ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද වපකෘ/ආ12 හා 2022.11.28 දිනැති ලිපිය මගින් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ පුරප්පාඩු පැවතිම නිසා එකී සේවයේ රාජකාරි කටයුතු පවත්වා ගෙන යාම සඳහා ගැටළු පැන නැගී ඇති බවට අමාත්‍යාංශය වෙත දන්වා තිබූ බව මෙම කරුණු දැක්විම මඟින් ප්‍රකාශ කර ඇත. එසේම 2021-2022 වර්ෂවල මෙරට පැවැති ආර්ථික අර්බුදය හමුවේ රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ රජයේ නිලධාරීන්ට වැටුප් රහිත නිවාඩු ලබා දීමට අදාළව ආයතන සංග්‍රහයේ විධි විධානයන්ගෙන් බැහැරව නැවත දැනුම් දෙනතුරු විශේෂ විධිවිධාන යටතේ දේශීය විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමට 2022.06.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබූ බවත් එම තීරණය සැලකිල්ලට ගෙන මෙම තීරණය ලබා දී ඇති බවත් 2022.11.28 දිනැති එම ලිපිය මගින් අමාත්‍යාංශය වෙත ප්‍රකාශ කර තිබූ බවයි.

ඒ අනුව වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ පුරප්පාඩු 13 ක් ද ප්‍රසූත නිවාඩු ලබා ගැනීම 05 ක් හා අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබා ගත් නිලධාරීන් 10ක්ද ලෙස සමස්ත පුරප්පාඩු 28 ක් පැවතිය ද ඉහත සඳහන් 14/2022 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කෘෂි උපදේශකවරුන් 04 දෙනෙකුට දේශීය හා විදේශීය නිවාඩු ලබා දීමට සිදුව ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් මෙම කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

පැමිණිලිකාර මහතා 2022.12.02 දින සිට 2023.12.01 දින දක්වා වෘත්තීය සම්මේලනයට නිදහස් නොකර උක්ත සඳහන් කෘෂි උපදේශක මහතුන් සඳහා පමණක් වැටුප් රහිත නිවාඩු ලබා දී නිදහස් කර හැරීමට කටයුතු කර ඇත්තේ විශේෂ විධි විධාන යටතේ නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව බවටද කරුණු දක්වා ඇත. තවද ආයතන සංග්‍රහයේ xxv වැනි පරිච්ඡේදයේ 11 වගන්තිය අනුව වෘත්තීය සමිතියක කටයුතු සඳහා පූර්ණ කාලීනව නිලධාරියකු මුදාහැරීමේදී අදාළ සංගමයේ ඉල්ලීම මත මුදා හැරීමේ කාලය වර්ෂ 4 ක් දක්වා දීර්ඝ කළ හැකි, නමුත් ආයතන සංග්‍රහය අනුව වෘත්තීය සමිති සම්මේලනයකට මුදාහැරීමේ වාර ගණනක් සම්බන්ධව එවැනි සඳහනක් නොමැති බවටද වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

එසේම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 (ආ) සහ 58 (1) ව්‍යවස්ථාව මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලය ප්‍රකාරව රජයේ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම පිළිබඳව හා ඊට ආනුෂංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම සඳහා වන කාර්ය පටිපාටික රීති මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලබන බවත්, එම කාර්යය පටිපාටික රීති වයඹ පළාත් සභාවට අනුගත කරගෙන වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියන් සම්බන්ධව කටයුතු කිරීමට විධිවිධාන සැලසීම සඳහා වයඹ කාර්යය

පටිපාටික රීති පනවා ඇති බවටත් කරුණු දක්වා ඇත. ඒ අනුව වයඹ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය අනුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු වයඹ පළාත් රාජ්‍ය සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම සම්බන්ධව විධිවිධාන පනවා ඇති බවත්, ඒ අනුව XII වැනි පරිච්ඡේදයේ 145 වගන්තියේ විධිවිධාන අනුව එසේ තාවකාලිකව හෝ ස්ථිරව රාජ්‍ය සේවයෙන් මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමේ බලය පත්කිරීම් බලධාරියා සතු වන බවටත් කරුණු දක්වා ඇත. එහි 145 හි VIII අනු අංකය යටතේ නිලධාරියා මුදාහල හොත් දැනට ඔහු සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ රාජකාරි ඉටු කිරීමට හෝ රාජකාරි පවත්වා ගෙන යාමට හෝ ගැටළු සහගත තත්වයක් හෝ දුෂ්කරතාවයක් හෝ හානිදායක තත්වයක් හෝ ඇතිවන බව පැහැදිලිව පෙනී යන විට මුදාහැරීම ප්‍රතික්ෂේප කළ හැකි බවටද කරුණු දක්වා ඇත.

මෙම වගඋත්තරකාර පාර්ශව විසින් ඉදිරිපත් කර ඇති ලේඛන මගින් පැහැදිලි කර ඇත්තේ පැමිණිලිකාර මහතාගේ පිපී එස්සී/තාක්ෂණ 01/2010/06 හා 2011/11/28 දිනැති පත්වීම් ලිපිය අනුව, මෙම නිලධාරියාගේ පත්වීම් බලධරයා වනුයේ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බවත්, ඒ අනුව පත්වීම් ලිපියේ කොන්දේසි වලට අනුව මෙම නිලධාරියා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා කලින් නිකුත් කරන ලද නිති හා රෙගුලාසි වලට යටත් විය යුතු බවත් පෙන්වා දී ඇත.

එසේම මෙම වාර්තාව තුලින් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ රා.ප.ච. අංක 15/97 අනුව වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව රජයේ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීම සඳහා විධිවිධාන ඉදිරිපත් කර ඇති බවයි. ඒ අනුව එම චක්‍රලේඛයේ 02 වැනි ජේදයේ සඳහන් පරිදි නිලධාරියකු වෘත්තිය සමිති/සම්මේලන කටයුතු සඳහා නිදහස් කිරීමට නම් සංගමයේ ඉල්ලීම නිලධාරියාගේ කැමැත්ත, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද අත්‍යවශ්‍ය බවට කරුණු දක්වා ඇත.

මෙම කරුණු සියල්ල සළකා බැලීමේදී වයඹ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ හා රා.ප.ච. 15/97 හි විධිවිධාන අනුව අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය අනුව වෘත්තිය සමිති සම්මේලන වලට රාජ්‍ය සේවයෙන් පූර්ණ කාලීනව නිදහස් කිරීම තීරණය වන බව දක්වා ඇත. තවද පැමිණිලිකාර මහතා 2023.10.02 දින සිට 2024.10.02 දින දක්වා වසරක කාලයකට වෘත්තිය සම්මේලනයට පූර්ණ කාලීනව නිදහස් කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>**නිරීක්ෂණ**</u>

- පැමිණිලිකරු විසින් තමා සේවය කරනු ලබන ආයතනය වන වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත වෘත්තිය සමිති කටයුතුවල නියැලීම සඳහා පූර්ණ කාලීනව නිදහස් වීමේ අවශ්‍යතාව මත රාජ්‍ය සේවයෙන් වැටුප් සහිත නිවාඩු ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් 2022.12.01 දිනැතිව අයදුම්පතක් මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එම අයදුම්පත වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ එම තීරණය වයඹ පළාත් වාරිමාර්ග,සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය සහ ගොවි ජන සංවර්ධන අමාත්‍යාංශය ලේකම්වරයාගේ අනුමැතිය මත සේවා අවශ්‍යතාවය යන කරුණ පදනම් කරගෙන ප්‍රතික්ෂේප කර ඇති බව නිරීක්ෂණය වේ.

  තවද එම තීරණයම වයඹ පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ද නිර්දේශ කර ඇති අතර (2023.01.17 දිනැති ලිපිය) එම නිර්දේශය ද සැලකිල්ලට ගෙන වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්ද (2023.02.03 දිනැතිව) පැමිණිලිකාර මහතාහට රාජ්‍ය සේවයෙන් වැටුප් සහිත නිවාඩු ලබා ගැනීමට සිදු කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව පැමිණිලි පාර්ශවයේ හා වගඋත්තරකාර පාර්ශවයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් අනුව නිරීක්ෂණය වේ.

- පැමිණිල්ලට අදාළව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී නිරීක්ෂණය වන්නේ රාජ්‍ය සේවකයන් හට රාජ්‍ය සේවයේ යෙදී සිටියදී වෘත්තීය සමිති කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් අවස්ථාව ලබා ගැනීම සඳහා ආයතන සංග්‍රහය මගින් ඉඩ කඩ සලසා දී ඇති බවයි. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව රජය පිළිගත් කිසියම් වෘත්තීය සමිති සම්මේලනයක නිලධාරීන් දෙදෙනෙකු හට එකී සම්මේලනයේ කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කිරීමට හැකියාවක් පවතින බවයි. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/1997 හා 04/2012 පදනම් කරගනිමින් ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ විධිවිධාන අනුව පූර්ණකාලීනව වෘත්තිය සමිති හා වෘත්තිය සමිති සම්මේලන කටයුතු සඳහා රාජ්‍ය නිලධාරීන් මුදා හැරීම කළ යුතු බවට 2012.02.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බවද පැමිණිලිකාර පාර්ශවය විසින් 2024.11.22 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලේඛන සහිතව ඉදිරිපත් කර ඇත. පැමිණිලි පාර්ශවයේ එකී කරුණු දැක්වීම් සැළකිල්ලට ගැනීමේදී ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 6.1 වගන්තිය මඟින් රජය පිළිගත් වෘත්තීය සමිති සම්මේලනයක පූර්ණකාලීන කටයුතු සඳහා මුදාහැරීමට ඉඩකඩ සළසා ඇති බවත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/1997 හා 04/2012 පදනම් කරගනිමින් ආයතන සංග්‍රහයේ XXV වන පරිච්ඡේදයේ 6.1 විවිධාන අනුව පූර්ණකාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා රාජ්‍ය නිලධාරීන් මුදා හැරීම කළ යුතු බවට ප්‍රතිපාදන සලසා ඇති බව එම චක්‍රලේඛ හා ආයතන සංග්‍රහය අධ්‍යනය කිරීමේදී නිරීක්ෂණය වේ.

- වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 144 වන වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කර ඇති බවට පැමිණිලිකරු විසින් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත. ඒ පිළිබඳ අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වන්නේ වයඹ පළාත් කාර්ය පටිපාටික රීතින්හි 143 වගන්තිය අනුව රජයේ සේවකයෙකු වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදාහැරීම සම්බන්ධව අවස්ථාවන් 17 දක්වා ඇති බවයි. එම අවස්ථාවන් 17 පහත පරිදි වේ.

I. ජනාධිපති ලේකම් කාර්යාලයේ තනතුරකට;
II. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්යය මණ්ඩලයේ තනතුරකට;
III. ජනාධිපතිවරයා විසින් පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලබන කොමිෂන් සභාවක සේවයට;
IV. රාජ්‍ය සේවයට;
V. වෙනත් පළාත් සභා රාජ්‍ය සේවයකට;
VI. පාර්ලිමේන්තු අමාත්‍යවරයකුගේ / මන්ත්‍රීවරයාගේ කාර්ය මණ්ඩලයකට;
VII. පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලයේ තනතුරකට;
VIII. පළාත් සභා ආණ්ඩුකාරවරයාගේ/අමාත්‍යවරයකුගේ/කාර්ය මණ්ඩලයට;
IX. ස්වේච්ඡා බල සේනාවේ සේවයට;
X. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති විශ්ව විද්‍යාලයක තනතුරකට;
XI. රජයේ සංස්ථාවක/ අධිකාරියක / සමාගමක / ව්‍යවස්ථාපිත ආයතනයක තනතුරකට;
XII. රජයේ ව්‍යාපෘතියක තනතුරකට;
XIII. පළාත් සභාවේ ප්‍රඥප්තියක් මගින් පිහිටුවා ඇති ආයතනයකට;
XIV. රජයට 50% කට වැඩි කොටස් ප්‍රමාණයක් හිමි හා පාලන බලය හිමි සමාගමක තනතුරකට;

XV. අනුමත සාමාජික සංඛ්‍යාව සහිත රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය අංශයේ වෘත්තීය සමිතියක නිලයකට;

XVI. අනුමත සාමාජික සංඛ්‍යාව සහිත රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය අංශයේ සුබ සාධක සංගමයක නිලයකට;

XVII.විදේශ දූත මණ්ඩල සේවයට යන අවස්ථාවන්ය.

එම අවස්ථාවන් අතරින්, V, VII, VIII, XIII යන අවස්ථාවන්හි දී හැර අනිකුත් අවස්ථා වලදී අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සැලකෙනුයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වන බවත් 143 V, VII, VIII හා XIII හි සඳහන් අවස්ථා වලදී ලේකම්වරයා ලෙස සැලකෙන්නේ වයඹ පළාත් සභා ප්‍රධාන ලේකම්වරයා බවයි.

එසේ වුවද වගඋත්තරකාර පාර්ශවය වන කෘෂිකර්ම හා වාරිමාර්ග ධීවර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.10.14 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපිය මගින් ප්‍රකාශ කර ඇත්තේ වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය මගින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු වයඹ පළාත් රාජ්‍ය සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම සම්බන්ධව විධිවිධාන පනවා ඇති බවයි. ඒ අනුව එම පරිච්ඡේදයේ 145 වන වගන්තියේ විධිවිධාන අනුව එසේ තාවකාලිකව හෝ ස්ථිරව රාජ්‍ය සේවයෙන් මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමේ බලය පත්කිරීම් බලධාරියා සතු වන්නේය යන බවත් එහිදී එම කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 145 වගන්තිය ප්‍රකාරව නිලධාරියා මුදාහලහොත් දැනට ඔහු සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ රාජකාරී ඉටු කිරීමට හෝ රාජකාරි පවත්වාගෙන යාමට හෝ ගැටලු සහගත තත්ත්වයක් හෝ දුෂ්කරතාවයක් හෝ හානිදායක තත්ත්වයක් ඇති හෝ ඇතිවන බව පැහැදිලිව පෙනී යන විට මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමේ බලය පත් කිරීම් බලධාරියා වන වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුවන බවද එම ලිපිය මගින් ප්‍රකාශ කර ඇතත් ඉහත වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 143 වගන්තිය ප්‍රකාරව එම බලයන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු නොවන බව සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව සමස්ත ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ වෘත්තිය සමිති සම්මේලනයේ සභාපතිවරයා වන පැමිණිලිකාර ඒ.එන්. උදයසිරි මහතා විසින් 2023 වර්ෂය සඳහා විධිමත් පරිදි අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරමින් පූර්ණකාලීන වෘත්තීය සමිති රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සිදුකර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සිදු කර ඇත්තේ වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නිර්දේශය මත වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වන බව නිරීක්ෂණය වන අතර එය වයඹ පළාත් කාර්ය පටිපාටික රීති ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්‍ෂණය වේ.

- එසේ වුවද ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයක සේවය කරන රාජ්‍ය සේවකයෙකුගේ නිවාඩු අනුමත කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන පරිපාලන බලතල හිමිවන්නේ අදාළ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ ඔහු විසින් බලය පවරා ඇති පළාත් සභා නිලධාරීන්ටය. ඒ සඳහා මධ්‍යම රජයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා සෘජුව මැදිහත් නොවන අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් පාලන විෂය පවතින්නේ පළාත් සභා සතු බලතල යටතේය. එබැවින් පළාත් පාලන ආයතනවල සේවකයන් පාලනය වන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරයා යටතේ මිස මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ නොවන කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

සාමාන්‍ය පරිපාලන රීති අනුව, සේවකයෙකුගේ දෛනික නිවාඩු අනුමත කිරීමේ මූලික බලය තිබෙන්නේ එම ආයතනයේ ප්‍රධානියාට (උදාහරණයක් ලෙස: මහ නගර සභාවක නම් නගර කොමසාරිස්වරයාට, ප්‍රාදේශීය සභාවක හෝ නගර සභාවක නම් ලේකම්වරයාට) වන අතර විශේෂ හෝ විදේශ නිවාඩු ආයතන ප්‍රධානියාගේ බල සීමාවෙන් ඔබ්බට යන විශේෂ නිවාඩු (උදා: වැටුප් රහිත විදේශ නිවාඩු, දිගුකාලීන අධ්‍යයන නිවාඩු) අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය පැවරෙන්නේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බවද නිරීක්ෂණය වේ.

එසේ වුවද මධ්‍යම රජයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් මුළු රටේම රාජ්‍ය සේවකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන "ආයතන සංග්‍රහය"සහ පොදු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින්ද නිවාඩු ලබාදීමේදී මූලික මඟපෙන්වීම් ලෙස අනුගමනය කරනු ලබන නමුත් සේවකයා කළමනාකරණය කිරීමේ ඍජු බලධාරියා වන්නේ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු පළාත් සභා බලධාරීන්ට බවද පෙනී යයි.

ඉහත සියලු කරුණු අනුව පෙනී යන්නේ වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දෝශසහගත බවක් පවතින බවය.

- තවද 2023 වර්ෂය සඳහා පැමිණිලිකරු විසින් සිය වෘත්තීය සමිති සම්මේලනයේ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා නිවාඩු ඉල්ලීමක් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ මඟින් 2022.12.02 දිනැතිව ඉදිරිපත් කර ඇතත් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එය ප්‍රතික්ෂේප කර තිබුණද 2021 හා 2022 වර්ෂ තුළ දී එම අමාත්‍යාංශයේ කෘෂි උපදේශකවරුන් කිහිප දෙනෙකුම විවිධ අවශ්‍යතා මත සිදු කරන ලද නිවාඩු ඉල්ලීම් අනුව සේවයෙන් මුදා හැරීමට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය හිමිව තිබූ බව වගඋත්තරකාර පාර්ශවය මෙන්ම පැමිණිකාර පාර්ශවය මගින් ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු දැක්වීම් අනුව නිරීක්ෂණය වේ. එහිදී 2022 වර්ෂයේ අවසන් කාර්තුවේදී කෘෂි උපදේශකවරුන් කිහිපදෙනෙකු ට පහත පරිදි සේවයෙන් මුදා හැර ඇති බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

  1. ආර්. එම්. ටී. එස්. රණසිංහ මයා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කුලියාපිටිය 2022.09.05 2026.09.04 දක්වා දේශීය අධ්‍යයන නිවාඩු.

  2. ඩබ්. එම්. එස්. එන්. විජේකුරුප්පු මයා - රජයේ ගොවිපල වාරියපොල - වැටුප් රහිත දේශීය නිවාඩු 2023.01.01-2027.12.31 නිවාඩු අයදුම් කළ දිනය 2022.11.17 අනුමත කළ දිනය 2022.12.19

  3. ආර්. ඒ.සි.කෞශලයා මිය - විදේශ අධ්‍යන නිවාඩු - 2022.08.25-2024.06.08.23 අයදුම් කල දිනය 2022.07.04 අනුමත කළ දිනය2022.08.18

  4. ඩබලිව්.එම්.ජී. එස් වික්‍රමසිංහ මයා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - වැටුප් රහිත විදේශ නිවාඩු -2022.05.07- 2024.09.30

තවද 2023 වර්ෂයේ මුල් කාර්තුවේදී පහත නිලධාරීන් සේවයෙන් මුදා හැර ඇති බවද තවදුරටත් නිරීක්ෂණය වේ.

1. ඒ. එන්. එස්. හෙට්ටිආරච්චි මයා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල - වැටුප් රහිත නිවාඩු-2023.01.01-2027.12.31.

2. එන්.ඒ.ජී. ඒ. වික්‍රම මයා - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය පුත්තලම - දේශීය නිවාඩු- 2023.03.01-2028.02.23 අයදුම් කළ දිනය 2023.01.04-අනුමත කළ දිනය 2023.02.07.

3. ජේ.එස්.ඊ.බංඩාර මිය - දිවුල්ලෑගොඩ කෘෂිකර්ම උපදේශක කාර්යාලය -විදේශ නිවාවු - 2023.02.02

ඒ අනුව අදාළ අමාත්‍යාංශයේ සමාන වෘත්තීන් හී නියැලෙන නිලධාරීන් එනම් කෘෂි උපදේශක නිලධාරීන්ගේ විවිධ අවශ්‍යතාවයන් අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව රාජ්‍ය සේවයෙන් වැටුප් රහිතව හා වැටුප් සහිතව යනාදී වශයෙන් නිවාඩු ලබා පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැර ඇති බව නිරීක්ෂණය වේ. කරුණු එසේ තිබියදී, මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන ඒ. එන්. උදයසිරි මහතා සමස්ත ලංකා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සම්මේලනයේ සභාපතිවරයා ලෙස තම සම්මේලනයේ රාජකාරී ඉටු කිරීම සඳහා රාජ්‍යය සේවයෙන් පූර්ණ කාලීනව නිදහස්වීම සඳහා සිදු කරන ලද නිවාඩු ඉල්ලීම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම යන මූලධර්මයට පටහැනිව කටයුතු කිරීමක් සිදු බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

මෙම ක්‍රියාවලිය තුළ පෙනී යන තවත් කරුණක් වන්නේ වයඹ පළාත් කෘෂිකර්ම,වාරිමාර්ග,සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය සහ ගොවි ජන සංවර්ධන අමාත්‍යාංශය මගින් එවකට ක්‍රියාත්මක වූ පෝෂණ මට්ටම සුරැකීමේ වැඩසටහන් සඳහා කෘෂි උපදේශකවරුන්ගේ සේවා අවශ්‍යතාවය මත පදනම්ව පැමිණිලිකාර කෘෂි උපදේශක මහතා විසින් කර ඇති නිවාඩු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. එසේ වුවද උක්ත කරුණු අනුව එම කාල වකවානුව තුළ දී ම අවස්ථා කිහිපයකදී වෙනත් කෘෂි උපදේශකවරුන් කිහිපදෙනෙකු හට විවිධ කාරණා පදනම් කර ගනිමින් නිවාඩු අනුමත කර ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් එම අනුමත කිරීම්හිදී සේවා අවශ්‍යතාවය යන්න පිළිබඳ සළකා බලා නැත්තේ ඇයි ද යන්න ප්‍රශ්න සහගත කරුණක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

- 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ඇ) ව්‍යවස්ථාව මගින් සෑම පුරවැසියෙකුටම වෘත්තීය සමිති පිහිටුවීමට සහ ඒවාට බැඳීමට මූලික අයිතිවාසිකම හිමි වන අතර, රාජ්‍ය සේවකයන්ට ද මෙම අයිතිය පොදුවේ වලංගු වේ. එසේ වුවද මෙම නිවාඩු අනුමත නොකිරීම තුළින් පැමිණිලිකරුගේ එකී අයිතිවාසිකම අහිමි වීමක් හෝ සීමාවක් සිදු වන බවක් නිරීක්ෂණය වන්නේ නැත. තවද රැකියාවේ නියැලෙන අතරතුර කිසියම් වෘත්තීය සමිතියක් පිහිටුවීමට හෝ වෘත්තීය සමිතියක සාමාජිකත්වය ලබා ගැනීමට පැමිණිලිකරුට බාධාවක් නොමැති බවද නිරීක්ෂණය වේ.

- ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ නිරත නිලධාරියෙකුට නිවාඩු ලබා ගැනීමේදී සිදුවන නිදහස අහිමිවීම් හෝ නිවාඩු ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ නෛතික සහ පරිපාලනමය පසුබිම ශ්‍රී ලංකා ආයතන සංග්‍රහය සහ ශ්‍රේෂ්ඨාධිකරණ මූලධර්ම අනුව පැහැදිලි කරගත යුතුය. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXV 4 වන වගන්තිය ප්‍රකාරව පූර්ණකාලීන වෘත්තීය සමිති කටයුතු සඳහා සංගමයක නිළධාරියෙකු මුදාහැරීම සම්බන්ධව පටිපාටින් ඉදිරිපත් කර ඇත. තවද එම පරිච්ඡේදයේ 6 වන වගන්තිය මගින් වෘත්තීය සමිති සම්මේලනයක් සඳහා පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරීන් මුදවා හැරීම සම්බන්ධව වැඩිදුරටත් ප්‍රතිපාදන සඳහන්ව ඇත. මෙහිදි පහත පරිදි එවැනි ප්‍රතිපාදන ඉදිරිපත් කළ හැක.

  - වෘත්තීය සමිති කටයුතු වෙනුවෙන් සහභාගී වන සාමාජිකයින් සහ නිලධාරීන්ට විශේෂ රාජකාරි නිවාඩු ලබා ගැනීමට අයිතියක් ඇත

- වාර්ෂික මහා සභා රැස්වීම්: පිළිගත් වෘත්තීය සමිතියක වාර්ෂික මහා සභා රැස්වීමට හෝ විශේෂ මහා සභා රැස්වීම්වලට සහභාගී වීම සඳහා නිලධාරීන්ට රාජකාරි නිවාඩු ලබා ගත හැක.
- කාලීන කමිටු රැස්වීම්: වෘත්තීය සමිතියක විධායක කමිටු රැස්වීම් සඳහා සහභාගී වන නිලධාරීන්ට (නියමිත සීමාවන්ට යටත්ව) රාජකාරි නිවාඩු හිමි වේ.
- ශාඛා සමිති රැස්වීම්: වෘත්තීය සමිතිවල ශාඛා රැස්වීම් සඳහා සහභාගී වීමටද ආයතන ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ඇතිව කාලය වෙන් කරවා ගත හැක.
- පූර්ණකාලීන නිදහස් කිරීම් : යම් රාජ්‍ය නිලධාරියෙකු පිළිගත් වෘත්තීය සමිතියක ප්‍රධාන නිලධාරියෙකු ලෙස (සභාපති, ලේකම් වැනි) තේරී පත්වුවහොත්, එම සමිතියේ කටයුතු වෙනුවෙන් පමණක් සේවය කිරීමට වැටුප් සහිතව පූර්ණකාලීනව මුදා හැරීමට රජය ප්‍රතිපාදන සලසා ඇත.

ලංකාවේ රාජ්‍ය සේවය තුළ "නිවාඩු ලබාගැනීම" යනු සේවකයෙකුට හිමි නිරපේක්ෂ අයිතිවාසිකමක් නොවන අතර, එය රාජ්‍ය පරිපාලන රීති මඟින් පාලනය වන්නකි. එහිදි නිවාඩු දීම ප්‍රතික්ෂේප කිරීම සාමාන්‍ය පරිපාලනමය පියවරක් වුවද, ඇතැම් අවස්ථාවලදී එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් දක්වා බරපතල විය හැක. ඒ පහත අවස්ථාවලදීය.

වෘත්තීය සමිති ක්‍රියාකාරකම්වලට බාධා කිරීම: වෘත්තීය සමිති ආඥාපනත සහ ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදය අනුව වෘත්තීය සමිති රැස්වීම්වලට සහ නිල කටයුතුවලට සහභාගී වීම සඳහා රාජ්‍ය සේවකයන්ට "රාජකාරි නිවාඩු" හිමිවේ. යම් නිලධාරියෙකු වෘත්තීය සමිති ක්‍රියාකාරකම්වල නිරත වීම වැළැක්වීමේ චේතනාවෙන් ඔහුගේ නිවාඩු සිතාමතාම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ඇ) ව්‍යවස්ථාව (වෘත්තීය සමිති අයිතිය) උල්ලංඝනය කිරීමකි.

දේශපාලන හෝ පෞද්ගලික පළිගැනීම් එකම ශ්‍රේණියේ වෙනත් සේවකයන්ට නිවාඩු ලබා දෙමින්, කිසියම් නිලධාරියෙකුගෙන් පෞද්ගලිකව පළිගැනීමේ අරමුණින් හෝ ඔහුගේ දේශපාලන/වෙනත් ස්ථාවරයන් මත පදනම්ව නිවාඩු ප්‍රතික්ෂේප කරන්නේ නම්, එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි.

රාජ්‍ය සේවයේ නිවාඩු ප්‍රතික්ෂේප කිරීම සාමාන්‍යයෙන් "නීති විරෝධී නිදහස අහිමි කිරීමක්" නොවේ. නමුත්, එම නිවාඩු අහිමි කිරීම බලධාරීන්ගේ පෞද්ගලික හේතු මත හෝ වෘත්තීය සමිති වල ක්‍රියාකාරකම් අඩාල කිරීමට හෝ අත්තනෝමතිකව වෙනස් කොට සැලකීමක් මත සිදු කර ඇති බව ඔප්පු කළ හැකි නම්, අගතියට පත් රාජ්‍ය සේවකයාට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමේ හැකියාවඇති අතර ඒ සඳහා මානව හිමිකම් කොමිෂන් සභවට පැමිණිලි කිරීමේ අයිතියද ඇත.සාමාන්‍යයෙන් නිවාඩු සේවකයකුගේ අයිතියක් නොවුවද, කිසියම් සේවකයෙකුගේ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් අක්‍රිය කිරීමේ කිරීමේ චේතනාවෙන් හෝ අත්තනෝමතිකව කටයුතු කරමින් නිවාඩු ප්‍රතික්ෂේප කරන්නේ නම්, එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව (සමානත්වයේ අයිතිය) උල්ලංඝනය කිරීමක් වන බවයි.

රාජ්‍ය සේවයේ පොදු රීතිය වන්නේ නිවාඩු අනුමත නොකිරීම නීති විරෝධී නොවන බවයි. නමුත් පාලනාධිකාරිය විසින් තම පරිපාලන බලය අත්තනෝමතික ලෙස හෝ පළිගැනීමේ චේතනාවෙන් භාවිත කර නිවාඩු අහිමි කර ඇති බව ඔප්පු වුවහොත් පමණක් අධිකරණය සේවකයා වෙනුවෙන් මැදිහත් වේ. පාලනාධිකාරියේ තීරණය නිවාඩු ප්‍රතික්ෂේප කළේ සැබෑ ලෙසම ආයතනයේ සේවක හිඟය හෝ මහජන සේවයේ හදිසි අවශ්‍යතාවයක් මතද යන්න අවබෝධ කර ගත යුතුය. එහිදි නිවාඩු ප්‍රතික්ෂේප කිරීම එක් පුද්ගලයෙකුට අදාල වන සේ

කටයුතු කළේද යන්න සලකා බැලීමේදී අදාල ඉල්ලීම සිදු කල අවස්ථාව වන විට හා ඊට පෙර හා පසු ආසන්නතම කාල සීමාවන් තුල ඉල්ලීම සලකා බැලීම හා අතිශය වැදගත් වේ. මෙහිදී ද්වේෂ සහගත චේතනාවක් තිබේද හා නිවාඩු ප්‍රතික්ෂේප කිරීම පිටුපස දේශපාලන, පෞද්ගලික හෝ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් අඩපණ කිරීමේ චේතනාවක් අනුවද යන්න නිසි ලෙස පිරික්සා බැලිය යුතුය.

මෙම පැමිණිල්ල පිළිබඳ ගැඹුරින් අධ්‍යයන කිරීමේදි පැහැදිලි වන කාරණය වන්නේ ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදය දක්වා ඇති වෘත්තීය සමිති සහන රාජ්‍ය නිලධාරීන්ට භුක්ති විඳීමට පූර්ණ අයිතිය ඇති බවත් එම අයිතිවාසිකම් සාධාරණ හේතුවක් නොමැතිව අවහිර කිරීමට පාලනාධිකාරියට නොහැකි බවත්ය. මෙකී කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිලිකාර කෘෂි උපදේශක මහතාගේ නිවාඩු ඉල්ලීම අනුමත නොකිරීමේ ක්‍රියාවලිය තුළ දී ඔහුට හිමි වෘත්තීය සමිති කටයුතු වල නියැලීමේ අයිතියට බාධා කිරීමක් බව නිරීක්ෂණය නොවූවද සමාන කාල වකවානුවක අනෙකුත් කෘෂි උපදේශකවරුන්හට සේවා අවශ්‍යතාව යන පදනම නොසලකා නිවාඩු අනුමත කිරීමත් හා පැමිණිලිකාර කෘෂි උපදේශක මහතාගේ නිවාඩු සේවා අවශ්‍යතාවය යන පදනම සලකා අනුමත නොකිරීමත් යන වගඋත්තර පාර්ශවයේ අසමාන ක්‍රියාකලාපය තුළින් නීතිය ඉදිරියේ සමානව සැලකීම යන මූලධර්මයට පටහැනිව කටයුතු කිරීමක් වන බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

- තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2022,(2022.06.22) මඟින් පහත පරිදි රාජ්‍ය සේවයෙන් විදේශ නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් විධි විධාන පනවා ඇත. එහි දෙවන වගන්තියේ පහත පරිදි රාජ්‍යය ආයතන ප්‍රධානීන් ,අමාත්‍යාංශ ලේකම් වරුන් කටයුතු කිරීමේදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කලයුතු බවට දක්වා ඇත.

අ) විදේශ ගත වීමට

නිලධරයකුගේ හැකියා වර්ධනය කර ගැනීම හෝ විදේශ ගත වීමෙන් අනතුරුව රැකියාවක යෙදීම හෝ සඳහා මෙම නිවාඩුව ලබා දෙන අතර. එහි දී මුල් අවස්ථාවේ දී ම රැකියාවක නිරත වන බවට තොරතුරු ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය නොවන අතර නිසි ක්‍රම වේදය අනුගමනය කර වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු ය.

ආ) විදේශීය ආයතනයක රැකියාවක නිරත වීමට

මෙහි දී නිලධරයා විසින් වැටුප් රහිත විදේශ නිවාඩු කාලය තුළ දී විදේශයේ දී නිරත වීමට අපේක්ෂා කරන රැකියාව සහ ඊට අදාළ තොරතුරු නිවාඩු අනුමත කරන බලධරයා වෙතඉදිරිපත් කර නිසි පරිදි වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු ය.

තවද එම චක්‍රෙල්ඛයේ 3වන වගන්තිය පරිදි, වයස අවුරුදු 35ට අඩු රජයේ නිලධරයන්ට තොරතුරු තාක්ෂණ දැනුම, ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක/භාෂා දැනුම වර්ධනය කර ගැනීමට හෝ පිළිගත් ආයතනයක වෘත්තීය පුහුණුවක් සම්පූර්ණ කිරීම සඳහා හෝ වසරක කාලයක උපරිමයට යටත්ව දේශීය හෝ විදේශීය වැටුප් රහිතනිවාඩු ලබා ගත හැකි ය. මෙහි දී ඊට අදාළ තොරතුරු නිවාඩු අනුමත කරන බලධරයා වෙත ඉදිරිපත් කර නිසි පරිදි වැටුප් රහිත දේශීය හෝ විදේශීය නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු බවට දක්වා ඇත. එමෙන්ම එම චක්‍රෙල්ඛයෙහි තවද එම චක්‍රෙල්ඛයෙහි 4 වගන්තිය අනුව ඉහත වගන්ති 2 හි හෝ 3 හි හෝ සඳහන් පරිදි වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා නිලධරයන්ට එම චක්‍රලේඛනයේ (අ) සිට (ජ) දක්වා වන උප වගන්ති අදාල වන බවට දක්වා ඇත. විශේෂයෙන් එහිදී මෙම පැමිණිල්ලට

අදාලව නිරීක්ෂණය වන උප වගන්තිය ලෙස (ක) උප වගන්තිය සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් බව නිරීක්ෂණය වේ.එම (ක) විධිවිධානය යටතේ නිවාඩු අනුමත කරනුයේ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් බව දක්වා ඇත. මේ සඳහා ලේකම්වරයාට සහාය වීම සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් සහ අමාත්‍යාංශයේ තවත් ජොෂ්ඨ නිලධරයන් තිදෙනෙකුගෙන් සමන්විත ස්ථාවර කමිටුවක් පත්කර එහි නිර්දේශය ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත්, අමාත්‍යාංශයකට අයත් දෙපාර්තමේන්තුවක නිලධරයකු සම්බන්ධයෙන් වන කල්හි අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මෙම කමිටුවේ විකල්ප සාමාජිකයෙකු ලෙස කටයුතු කළ යුතු බවත් දකවා ඇත. තවද රාජ්‍ය නිලධරයන් සඳහා මෙම ක්‍රම වේදයට අනුව නිවාඩු ලබා දීම තුළින් අදාළ රාජ්‍ය ආයතනවල කාර්යයන් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට බාධාවක් නොවන බවට නිවාඩු අනුමත කරන බලධරයා විසින් තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් නිවාඩු අනුමත කිරීම කළ යුතු බවට වැඩිදුටත් දක්වා ඇත. තවද නිලධරයන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් එක් එක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් තම තමන්ගේ විධිමත් කාර්ය පරිපාටි සකස් කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

එසේම මෙහිදී අංක 15/97 හා 1997.09.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වගන්තිය මඟින් දක්වා ඇති විධිවිධාන සළකා බැලීම අතිශය වැදගත් වේ. එහි 02 වගන්තියෙහි දක්වා ඇත්තේ නිලධාරියෙකු වෘත්තීය සමිති/සම්මේලන කටයුතු සඳහා නිදහස් කිරීමට නම් සංගමයේ ඉල්ලීම, නිලධාරියාගේ කැමැත්ත දෙපාරතමේන්තු ප්‍රධානියාගේ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද නිලධාරියා වෘත්තිය සමිති කටයුතු සඳහා දැනටමත් වසර 04 ට වැඩි ගණනක් සඳහා නිදහස් කරනු ලැබ ඇත්තම් අදාළ ඇමතිවරයාගේ/ඇමතිතුමියගේ නිරිදේශය ද (මෙම කොටස වෘත්තීය සමිති සම්මේලන වලට අදාළ නොවේ) ඒකාබද්ධ සේවයකට අයත් නිලධාරියකු සම්බන්ධයෙන් නම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ නිරිදේශය ද ආයතන අධ්‍යක්ෂ වෙත ලැබිය යුතුය.

එසේම අංක 04/2012 හා 2012.03.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2වන වගන්තිය මඟින් ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධාන අනුව පූර්ණකාලීනව වෘත්තීය සමිති හා වෘත්තීය සමිති සම්මේලන කටයුතු සඳහා රාජ්‍ය නිලධාරීන් මුදා හැරීම කළ යුතු බවට 20212.02.1 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බවට දක්වා ඇත.

ඉහත චක්‍රෙල්ඛ තුන පිළිබඳ අවධානය යොමු කිරීමේදී රාජ්‍ය සේවකයන් වෙත නිවාඩු ලබා දීමේදී වෘත්තීය සමිති/සම්මේලන කටයුතු සඳහා නිවාඩු ලබා දීමට ප්‍රතිපාදන වෙන් කර ඇති බව නිරීක්ෂණය වුවද මෙම පැමිණිල්ලට අනුව එම නිවාඩු අනුමත කිරීමේදී රාජ්‍ය සේවය කාර්යක්ෂමව පවත්වා ගෙන යාමේ අරමුණින් යැයි ප්‍රකාශ කරමින් පැමිණිලිකාර පාර්ශවයේ නිවාඩු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බව පෙනී යයි. එසේ වුවද වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් එම කාල වකවානුව තුළදී පැමිණිලිකරු හා සමාන මට්ටමේ සිටි වෙනත් කෘෂි උපදේශක නිලධාරීන් කිහිප දෙනෙකුගේ නිවාඩු ඉල්ලීම් අනුමත කිරීමේදී ඉහතින් පැහැදිලි කර ඇති පරිදි උක්ත චක්‍රලේඛවල එන රාජ්‍ය **සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම** යන කාරණය කෙරෙහි අවධානය යොමු කර නොමැති බව පෙනී යයි. වගඋත්තරකාර පාර්ශවයේ ඒකී ක්‍රියාකලාපය තුළින් පැමිණිලිකරු වෙනස්කොට සැලකීමකට භාජනය වී ඇති බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

**නිගමනය**

පැමිණිලිකරු විසින් තමා සේවය කරනු ලබන ආයතනය වන වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත වෘත්තිය සමිති කටයුතුවල නියැලීම සඳහා පූර්ණ කාලීනව නිදහස් වීමේ අවශ්‍යතාව මත රාජ්‍ය සේවයෙන් වැටුප් සහිත නිවාඩු ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් 2022.12.01 දිනැතිව අයදුම්පතක් (2022.12.01 දින සිට 2023.12.02 දක්වා කාල සීමාවට අදාළව) මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය අනුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු වයඹ පළාත් රාජ්‍ය සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම සම්බන්ධව වයඹ පළාත් කාර්ය පටිපාටි රීතින් අනුව එම බලය හිමි වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයාට වන නමුත් පැමිණිලිකාර ඒ.එන්. උදයසිරි මහතා විසින් පූර්ණකාලීන වෘත්තීය සමිති රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා නිවාඩු ලබා ගැනීමට එලෙස සිදුකර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම කර ඇත්තේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නිර්දේශය මත වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වන අතර එය වයඹ පළාත් කාර්ය පටිපාටික රීති අභිබවනය කරමින් කටයුතු කිරීමක් බව මතුපිටින් බැලූ විට නිරීක්ෂණය වේ. තවද එම තීරණයම ඉදිරියටත් ක්‍රියාත්මක කරමින් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් ද වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය සඳහා නිසි අධීක්ෂණයකින් තොරව අනුමැතිය ලබා දී ඇති අයුරුද නිරීක්ෂණය වේ.

එසේ වුවද ශ්‍රී ලංකාවේ පළාත් සභාවක සේවය කරන රාජ්‍ය සේවකයෙකුගේ නිවාඩු අනුමත කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන පරිපාලන බලතල හිමිවන්නේ අදාළ පළාත් සභාවේ විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ ඔහු විසින් බලය පවරා ඇති පළාත් සභා නිලධාරීන්ට ය. ඒ සඳහා මධ්‍යම රජයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මැදිහත් වීමක් සිදු නොවේ. එබැවින් කිසියම් පළාත් සභාවකට අයත් රජයේ සේවකයන් පාලනය වන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරයා යටතේ මිස මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ නොවන බවට කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වන අතර මේ තුළින් වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දෝශසහගත බවක් පවතින බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

තවද පැමිණිලිකාර කෘෂි උපදේශක මහතාගේ නිවාඩු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත්තේ රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වා ගෙන යාම යන කාරණය මත පදනම්ව වුවද වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් එම කාල වකවානුව තුළදී පැමිණිලිකරු හා සමාන මට්ටමේ සිටි වෙනත් කෘෂි උපදේශක නිලධාරීන් කිහිප දෙනෙකුගේ විවිධ අවශ්‍යතා මත සිදු කරන ලද නිවාඩු ඉල්ලීම් අනුමත කර ඇති අතර එහිදී පැමිණිලිකරු සම්බන්ධව ප්‍රකාශ කර ඇති රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම යන කාරණය කෙරෙහි අවධානය යොමු කිරීමක් සිදු කර නොමැති බවද පෙනී යයි. එහෙත් පැමිණිලිකරුගේ නිවාඩු ඉල්ලීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2012, 14/2022 එන විධිවිධාන පරිදි සේවා අවශ්‍යතාවය යන සාධකය මත නිවාඩු අනුමත කිරීම ප්‍රතික්ෂේප කර ඇති නමුත් එකී චක්‍රලේඛයන් පරිදි සේවා අවශ්‍යතාවය යන්න පිළිබඳ නොසළකා වෙනත් කෘෂි උපදේශක නිලධාරීන් කිහිප දෙනෙකුගේ නිවාඩු ඉල්ලීම් අනුමත කිරීම යන වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය තුළින් පැමිණිලිකරු වෙනස්කොට සැලකීමකට භාජනය වී ඇති බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

එහි දී පැමිණිලිකරු ඉල්ලුම් කළ දිනයට පසුව ඉල්ලීම් කළ කෘෂි උපදේශක නිලධාරීන් කිහිප දෙනෙකුටද එලෙස පූර්ණකාලීන රාජ්‍ය සේවයෙන් නිදහස්වීම සඳහා අනුමැතිය ලබාදී ඇති බවටද

තවදුරටත් කරුණු අනාවරණය වේ. එවැනි පසුබිමක කිසිදු සාධාරණ පදනමකින් තොරව අනෙකුත් නිලධාරීන් උදෙසා අනුගමනය කළ ක්‍රියාපටිපාටියට වෙනස්ව යමින් පැමිණිලිකරු සම්බන්ධයෙන් පමණක් අසමාන හා විෂම සැලකීමකට ලක් කර පූර්ණකාලීන රාජ්‍ය සේවයෙන් නිදහස්වීම සඳහා ඔහුහට අනුමැතිය ලබා නොදී ඇති බව නිරීක්ෂණය වේ. මෙකී කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිලිකාර කෘෂි උපදේශක මහතාගේ නිවාඩු ඉල්ලීම අනුමත නොකිරීමේ ක්‍රියාවලිය තුළ දී ඔහුට හිමි වෘත්තීය සමිති කටයුතු වල නියැලීමේ අයිතියට බාධා කිරීමක් කර ඇති බව නිරීක්ෂණය නොවූවද සමාන කාල වකවානුවක අනෙකුත් කෘෂි උපදේශකවරුන්හට සේවා අවශ්‍යතාව යන පදනම නොසලකා නිවාඩු අනුමත කිරීමත් හා පැමිණිලිකාර කෘෂි උපදේශක මහතාගේ නිවාඩු සේවා අවශ්‍යතාවය යන පදනම සලකා අනුමත නොකිරීමත් යන වගඋත්තර පාර්ශවයේ අසමාන ක්‍රියාකලාපය තුළින් නීතිය ඉදිරියේ සමානව සැලකීම යන මූලධර්මයට පටහැනිව කටයුතු කිරීමක් වන බවට කොමිෂන් සභාව නිගමනය කරනු ලබයි. තවද පෙර සඳහන් කරන ලද පරිදි පැමිණිලිකරුගේ පූර්ණකාලීන වෘත්තීය සමිති රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා නිවාඩු ලබා දීමේ දී වගඋත්තර පාර්ශවය ක්‍රියාකර ඇති ආකාරය තුළ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් එන නීතිය ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන්ගේ උක්ත ක්‍රියාපටිපාටීන් හේතුවෙන් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව මෙම පැමිණිල්ල මඟින් ප්‍රශ්නගත සිදුවීම වැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකට හේතු වන ක්‍රියාවන් මින් ඉදිරියට සිදු නොවන ආකාරයෙන් කටයුතු කිරීමට වගබලා ගත යුතු බවට 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙයින් නියෝග කරනු ලබයි.**

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්: අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග
අමාත්‍යාංශය,
80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.